(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 1(5).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 නොවැම්බර් මස 21 වැනි සෙනසුරාදා**

---

## 2015 නොවැම්බර් මස 28 වැනි සෙනසුරාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් ජනාධිපති ධුරය දරන තැනැත්තාගේ වැටුප, දීමනා හා විශ්‍රාම වැටුප් හිමිකම යෝජනා සම්මතයෙන් නිශ්චය කළ යුත්තේ ය.

ජනාධිපති ධුරය දරන තැනැත්තාගේ විශ්‍රාම වැටුප්, හිමිකම, එම ධුරය දැරීම අවසන් වීමට පෙරාතුවම ලැබීමට හිමිකම තිබූ වැටුපට සමාන මුදලක් වියයුතු බව 1986 මාර්තු මස 04 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා සම්මතය මගින් නිශ්චය කරන ලදී.

ඊට අනුකූලව, 1988 වර්ෂයේ සිට ඉදිරියට හිටපු ජනාධිපතිවරයන් වන ජේ.ආර්. ජයවර්ධන මහතාට, ඩී.බී. විජේතුංග මහතාට, හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ වැන්දඹු බිරිඳ වන හේමා ප්‍රේමදාස මහත්මියට සහ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් හිමිකම ජනාධිපතිවරයාගේ වැටුපට සමාන මුදලක් වූ මාසයකට රු. 25,000/- ක් විය.

2006 නොවැම්බර් මස 23 වැනි දින නිකුත් කරන ලද 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් 2006.07.01 දින සිට බලපවත්වන පරිදි එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ වැටුප මාසයකට රු. 25,000/- සිට රු. 97,500/- දක්වා ප්‍රතිශෝධනය කරන ලදී. අමාත්‍යවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා ද ප්‍රතිශෝධනය කරන ලදී.

අමාත්‍යවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා ප්‍රතිශෝධනය කිරීමට සමගාමීව කලින් සිටි අමාත්‍යවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විශ්‍රාම වැටුප් ද ප්‍රතිශෝධනය කරන ලදී. ජනාධිපතිවරයාගේ වැටුප ප්‍රතිශෝධනය කිරීමට අනුකූලව හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට ගෙවනු ලබන විශ්‍රාම වැටුපෙහි පමණක් කිසිදු ප්‍රතිශෝධනය කිරීමක් සිදු වී නොමැත.

ඉහත කී වැටුප් ප්‍රතිශෝධනයේ ප්‍රතිඵලයන් වශයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට දැනට ගෙවනු ලබන රු. 97,500/- ක මාසික විශ්‍රාම වැටුපට අනුව සලකන විට, මාසයකට රු. 25,000/- ක මාසික විශ්‍රාම වැටුපක් දැනට ලබන හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ විශ්‍රාම වැටුප් හිමිකමෙහි විෂමතාවයක් පැන නැගී ඇත.

ඉහත සඳහන් විෂමතාවයන් නිවැරදි කිරීම සාධාරණ හා යුක්ති සහගත යැයි අදහස් කරන බැවින්—

(අ) හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ මාසික විශ්‍රාම වැටුප් හිමිකම රු. 25,000/- සිට රු. 97,500/- දක්වා ප්‍රතිශෝධනය කිරීමටත්;

(ආ) හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ වැන්දඹු බිරිඳ වන හේමා ප්‍රේමදාස මහත්මියට රු. 97,500/- ක වැටුපෙන් 2/3 කට සමාන මාසික විශ්‍රාම වැටුපක් ගෙවීමට;

සහ

(ඇ) 2016.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ඉහත සඳහන් විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රතිශෝධන ක්‍රියාත්මක කිරීමටත්;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝගය,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13(1) (ඇ) වැනි වගන්තිය සහ 16 වැනි වගන්තිය සමග කියවිය යුතු, 112 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 25 දිනැති අංක 1907/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ, 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 975, 976 සහ 977 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ කරන නියෝගය,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශය මත විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යය පටිපාටි) පිළිබඳව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජුනි 8 දිනැති අංක 1918/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2015 දෙසැම්බර් මස 01 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

194/’15

ගරු ජයන්ත සමරවීර මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එල්. ටී. ටී. ඊ. ත්‍රස්ත ක්‍රියාවන්ට සම්බන්ධවීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට ගැනෙන වැරදි සඳහා සැකකරුවන් වී සිටින සහ දඬුවම් ලබා ඇති පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම්, වරදේ ස්වභාවය, ඔවුන් දැනට රඳවා තිබෙන බන්ධනාගාරය හා සිර මැදිරි අංකය, සිරකරුවා අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) 2015 ජනවාරි සිට 2015 ඔක්තෝබර් 20 දක්වා කාලය තුළ ඇප ලබාදී ඇති හා නිදහස්කර ඇති එල්. ටී. ටී. ඊ. සැකකරුවන් හා සිරකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඔවුන්ගේ නම්, ඇප ලබාදුන් හෝ නිදහස් කළ උසාවිය, සිරකඳවුර හා නිදහස් කළ දිනය එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් එතුමා තවදුරටත් සභාගත කරන්නෙහිද?

(ඉ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්ත ක්‍රියාවන්ට සම්බන්ධ වැරදි සඳහා දඬුවම් ලැබූවන් දේශපාලන සිරකරුවන් වශයෙන් සැලකීමට රජය නිගමනයකට එළඹ තිබේද; සහ

(ii) එසේ නම්, එසේ නිගමනයකට එළඹීමට හේතු කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

195/'15

ගරු විජිත හේරත් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ, බෝගස්වැව කලාපයේ, යුද්ධයෙන් අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ පවුල් 312ක් නැවත පදිංචිකර ඇති බවත්;

(ii) මෙම වැඩසටහන යටතේ ඔවුන්ට ගොඩ ඉඩම් අක්කර 1ක් සහ කුඹුරු ඉඩම් අක්කර 1ක් ලබාදීමට නියමිතව තිබූ බවත්;

(iii) මේ වනවිට අවුරුදු 3ක් ගතවී ඇතත්, ඉහත සඳහන් පරිදි ඉඩම් ලබාදීමක් සිදුවී නොමැති බවත්; සහ

(iv) තම ජීවනෝපාය අහිමි වීමෙන් ඔවුන් අන්ත අසරණ තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නේද; සහ

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

246/'15

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට 2015.01.30න් පසු පත් කළ සභාපතිවරයා විසින් පසුගිය මාස 10 තුළ ලබාගත්, මාසික වැටුප/ඉන්ධන හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තමන්ට හිමි වැටුප/ඉන්ධන හා දීමනාවන්ට අමතරව සභාපතිවරයා විසින් යම් මුදලක්/දීමනාවක් ලබාගෙන ඇත්නම්, ඒවා නැවත අයකර ගන්නේද;

(iii) 2015.01.30 සිට 2015.10.30 දක්වා වන කාලය තුළ උත්සව සඳහා කොපමණ මුදලක් වැයකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් , ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 02 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

88/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා නීති විද්‍යාලය තුළ අධ්‍යාපන කටයුතු සහ විභාග කටයුතු සිදුවන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014 වසරේ නීති විද්‍යාල සිසුන්ගේ විභාග ප්‍රශ්න පත්‍ර ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් නිකුත් කර තිබීම හේතුවෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරූ සිසුන්ට එක්වරම ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය වීමට සිදුවීම නිසා එම සිසුන්ට බලවත් අසාධාරණයක් හා අපහසුතාවයක් ඇතිවූ බවත්; සහ

(ii) මෙම කාරණය නිසා හිටපු අග්‍රවිනිශ්චයකාරතුමා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කර ඇති බවත්;

එතුමා තවදුරටත් දන්නෙහිද?

(ඇ) මින් ඉදිරියට නීති විද්‍යාලයේ සිසුන්ගේ විභාග සඳහා නිකුත් කරනු ලබන ප්‍රශ්න පත්‍ර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා උපදෙස් ලබාදෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

127/'15

ගරු විජිත හේරත් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හැටන් නගරයේ දුඹුරුගිරිය ප්‍රදේශයේ ලෝක බැංකු ආධාර මත ඉදි වූ නිවාස සමූහයක සිංහල, දෙමළ සහ මුස්ලිම් පවුල් 35ක් පමණ, වර්ෂ 33කට අධික කාලයක් තුළ පදිංචිවී සිටින බවත්;

(ii) මෙම පදිංචිකරුවන්ගෙන් කොටසකට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නීත්‍යානුකූල ඉඩම් ඔප්පු ලබාදී ඇති බවත්; සහ

(iii) වටවල වැවිලි සමාගම විසින් මෙම නිවැසියන්, නිවාසවලින් ඉවත්කර, එම භූමිය සමාගමට අත්පත්කර ගැනීම සඳහා අධිකරණමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හැටන්-දික්ඔය නගර සභාව මෙම නිවැසියන් පදිංචි භූමිය පවරා ගැනීම සඳහා ඒකමතිකව යෝජනාවක් සම්මත කර ඇති බවත්; සහ

(ii) මෙම භූමිය සමාගමට පවරා ගැනීම වළක්වා සාධාරණය ඉටුකර ගැනීම සඳහා එම නිවැසියන් විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ අදාළ දේශපාලනඥයන් දැනුවත් කර ඇති බවත්;

එතුමා තවදුරටත් දන්නෙහිද?

(ඇ) (i) මෙම කරුණු සැළකිල්ලට ගෙන වටවල සමාගමේ බලපෑම්වලින් මෙම නිවැසියන්ව මුදවාගෙන ඔවුන්ගේ නිවාස අයිතිය තහවුරු කරදීම සඳහා මැදිහත් වන්නේද; සහ

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

148/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට දරුවන් දෙදහසකට ආසන්න සංඛ්‍යාවක් විද්‍යා, තාක්ෂණ, වාණිජ හා කලා යන විෂය ධාරාවන් හතර යටතේ අධ්‍යාපනය ලබන මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය බරපතල ගොඩනැගිලි අර්බුදයකට මුහුණ පා සිටින බවත්;

(ii) නේවාසිකාගාරය, ශ්‍රවණාගාරය සහ තෙමහල් නව ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කළද, පසුගිය ජනවාරි මස 15 දින සිට එම සියලු ඉදිකිරීම් අතරමග නවතා දමා ඇති බවත්; සහ

(iii) ක්‍රීඩාපිටිය සඳහා බිම් කොටස් පවරාගනු ලැබුවද, එහි ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම විදුහලේ නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම දිනය කවරේද;

(iii) නවතා දමා ඇති අනෙකුත් ඉදිකිරීම් ආරම්භ කරන දිනය කවරේද;

(iv) දහස් ගණනක් වූ දරුවන්ට අත්‍යවශ්‍ය ක්‍රීඩා පහසුකම් සඳහා පිටිය සකස් කරන්නේද; සහ

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය වසා දැමීමේ උත්සාහයක් ඇතැයි ප්‍රචාරය වන මතයේ සත්‍ය අසත්‍ය බව එතුමා මෙම සභාවට හෙළිකරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

199/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 අප්‍රේල් 5 දින සිට 11 දින දක්වා කොලොම්බියාවේ පැවති ලෝක නාගරික සමුළුවට (WUF) සහභාගි වූ ශ්‍රී ලංකා (රජයේ) නියෝජිත කණ්ඩායමේ නම් කවරේද;

(ii) ඒ වනවිට ඔවුන් දැරූ රජයේ තනතුරු කවරේද;

(iii) එම නියෝජිත කණ්ඩායම තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) එම සංචාරය සඳහා වියදම් කළ මුදල කොපමණද; සහ

(v) එක් එක් අය වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරය සඳහා පාසල් ශිෂ්‍යයෙක් සහභාගී වූයේද;

(ii) එසේ නම්, ඔහුගේ නම, පාසල, ඔහුගේ එවකට වයස කවරේද;

(iii) ඔහුට පමණක් එම අවස්ථාව ලබාදීමේ විශේෂත්වය කවරේද;

(iv) උක්ත සංචාරය සඳහා එම ශිෂ්‍යයා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද; සහ

(v) මෙම සංචාරය සඳහා විදේශ අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

200/'15

ගරු අනුර දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පවතින පාඨමාලා කවරේද; සහ

(ii) එම එක් එක් පාඨමාලාව හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යයන වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබන විදේශීය හා දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව අධ්‍යයන වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වෛද්‍ය පීඨයට විදේශීය ශිෂ්‍යයන් බඳවාගැනීමේ නිර්ණායක කවරේද; සහ

(iii) එම විදේශීය ශිෂ්‍යයන්ගේ නම්, ඔවුන් කුමන රටක පුරවැසියෙකුද යන වග, විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සහ ඔවුන්ගෙන් අය කළ මුදල අධ්‍යයන වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) උක්ත විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කවරේද; සහ

(ii) ඔවුන්ගේ නම්, උසස් පෙළ විෂය ධාරාව, උසස් පෙළ ප්‍රතිඵල සහ Z අගය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

202/'15

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, වලව විශේෂ කලාපයේ ජීවත්වන ජනතාවට ඔවුන් ජීවත්වන භූමියේ නිසි අයිතිය පැවරී නොමැති බවත්;

(ii) පසුගිය සමයේ දේශපාලන හිතවත්කම් මත හිමිකම් පත්‍ර ලබාදී ඇති බවත්;

(iii) දැනට මෙම ඉඩම් හිමියන් සඳහා ඔප්පු ලබා දීමට යැයි පවසා ඉඩම් ඇස්තමේන්තුවක් සිදුකර ගෙන යන බවත්; සහ

(iv) මෙම ක්‍රමවේදය තුළ විනිවිදභාවයක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කලාපයට අයත් ඉඩම් හිමියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට හිමිකම් ඔප්පු ලබාදී ඇති ඉඩම් හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත (අ) (ii) හි සඳහන් හිමිකම් පත්‍ර ලබාදීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද; සහ

(iv) උක්ත (අ) (iii) හි සඳහන් ඇස්තමේන්තුව සිදු කරන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වනවිට හිමිකම් ඔප්පු ලබා දී නොමැති ඉඩම් හිමියන්ට විනිවිදභාවයකින් යුතුව හිමිකම් ඔප්පු ලබා දීම සඳහා යෝජිත වැඩපිළිවෙළක් තිබේ නම්, එය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

90/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගරු ශිරානි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමියගේ සභාපතිත්වයෙන් පත්කරන ලද ආයුධ ජාවාරම පිළිබඳව විමසා බලන කොමිසමේ වාර්තාවක් තිබේද;

(ii) එම වාර්තාව ප්‍රකාශයට පත් කරන්නේද; සහ

(iii) ප්‍රකාශයට පත්කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

151/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 සැප්තැම්බර් 30 දින වනවිට රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද; සහ

(ii) එම උපාධිධාරීන් සංඛ්‍යාව ඔවුන් ලබා ඇති උපාධිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උපාධිධාරීන් වෙත රැකියා ලබාදීම සඳහා වූ වත්මන් ආණ්ඩුවට ඇති වැඩපිළිවෙළ කවරේද; සහ

(ii) ඒ අනුව 2015 වර්ෂය සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට වාර්තා වී ඇති ආකාරයට රාජ්‍ය සේවයේ උපාධිධාරීන් සඳහා වූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 සිට 2019 දක්වා වර්ෂ පහ තුලදී විශ්වවිද්‍යාල තුළින් සහ බාහිර පාඨමාලා තුළින් උපාධිධාරීන් වීමට අපේක්ෂිත දූ දරුවන්ගේ සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) එකී වර්ෂ සඳහා රාජ්‍ය සේවයේ ඔවුන් වෙනුවෙන් නිර්මාණය වීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

196/'15

ගරු විජිත හේරත් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඒකාබද්ධව තිබූ උතුරු නැගෙනහිර පළාත් සභාව, උතුරු සහ නැගෙනහිර පළාත් සභා ලෙස වෙන්කල අවස්ථාවේදී, නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වූ නිලධාරීන් 270ක් උතුරු පළාත් සභාවට අනුයුක්ත කරන ලද බවත්;

(ii) අවුරුදු 7 ක පමණ කාලයක් මෙලෙස පදිංචි ප්‍රදේශයෙන් බැහැරව සේවය කිරීමෙන් එම නිලධාරීන් විශාල අපහසුතාවයන්ට ලක්වන බවත්;

(iii) මෙම නිලධාරීන් නැගෙනහිර පළාතට ස්ථාන මාරු ලබාගැනීම සඳහා අවස්ථා ගණනාවකදී උත්සාහ කළද එය අසාර්ථක වූ බවත්; සහ

(iv) නිලධාරීන් කීපදෙනෙක් පමණක් බලධාරීන්ගේ සහයෝගය ලබා ස්ථාන මාරු ලබාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ පදිංචිකරුවන් එම පළාත් සභාවේ සේවය කිරීම සඳහා කරන සාධාරණ ඉල්ලීම ඉටුකරන්නේද; සහ

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

201/'15

ගරු අනුර දිසානායක මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) වර්තමාන ශ්‍රී ලංකා ටෙලිකොම් සභාපතිවරයා මීට පෙර රාජ්‍ය ආයතනවල හෝ පෞද්ගලික ආයතනවල දැරූ තනතුරු කවරේද; සහ

(iv) වෙළඳ කළමනාකරණය හා ප්‍රචාරණය සම්බන්ධයෙන් ඔහුට ඇති අත්දැකීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සභාපති තනතුරේ වැටුප් වැඩි කිරීම සඳහා පසුගිය වසර දෙකක කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද; කවර ප්‍රමාණයකින්ද;

(iii) වර්තමානයේ ශ්‍රී ලංකා ටෙලිකොම් සභාපතිවරයාගේ මූලික වැටුප, දීමනා හා අනෙකුත් පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iv) ඔහුගේ මුළු වැටුප කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

206/'15

ගරු හේෂා විතානගේ මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාව පිළිබඳව සහ වතු ආශ්‍රිත ලයින් කාමර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, වතු ආශ්‍රිත නිවාස, ලයින් කාමර හා ඒ ආශ්‍රිතව ජීවත්වන ජන සංඛ්‍යාව කොපමණද;

(iii) එහි පාසල් යන වයසේ දරුවන් සංඛ්‍යාව සහ ඒ අතරින් පාසල් නොයන දරුවන් සංඛ්‍යාව කොපමණද; සහ

(iv) විදුලිබල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් දියත් කරන්නේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) වතු ආශ්‍රිත ජනයාගේ ලයින් කාමර මුල්කරගත් ජීවිතය නිමාකර ඔවුන් විධිමත් නිවාස තුළ පදිංචි කිරීමේ වැඩපිළිවෙළක් තිබේද; සහ

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ නිම කිරීමට බලාපොරොත්තු වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 04 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

91/’15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය අතුරු අයවැයෙන් සිමෙන්ති විකුණුම් මිල තුළ ඇතුළත්ව තිබූ රු. 90.00ක බද්දක් ඉවත් කරනු ලැබුවේ සිමෙන්ති මිල අඩු කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් නොවේද; සහ

(ii) ඒ නිසා රජයට මසකට අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම මිල අඩුකිරීම 2015 පෙබරවාරි මස 20 වන දින ගැසට් පත්‍රයේ පළකරනු ලදුව සිල්ලර මිල රු. 840.00ක් ලෙස නියම කර තිබේද;

(ii) එදින සිට අද දක්වා එම මිලට දිවයින පුරා සිමෙන්ති අලෙවි වන්නේද; සහ

(iii) නොඑසේ නම්, රජයේ ආදායමද, අහිමි වී පාරිභෝගිකයාට ලබාදීමට අරමුණු කළ සහනයද නොලැබී යාම බරපතල වරදක් නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අතුරු අයවැයෙන් ප්‍රකාශ කළ පරිදි මෙම මිල අඩුවීම ක්‍රියාත්මක කරවීම සඳහා පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එම පියවර බලපවත්වනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

153/’15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වලට පාසල් පාදකව ගුරු සහායකවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලදුව, අගලවත්ත, වියන්ගල්ල, අංක 25/2 දරන නිවසේ පදිංචි, එෆ්. රුෂානා මෆුර් මිය විසින් ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන ලද බවත්;

(ii) ඒ අනුව ඇය සම්මුඛ පරීක්ෂණය සඳහා 2015.03.02 දින කැඳවීම් අංක 199 (B) යටතේ පෙනී සිටි බවත්; සහ

(iii) ඇයගේ පදිංචි ප්‍රදේශයේ වතු පාසල්වල එම තනතුර සඳහා පුරප්පාඩු පැවතියද, රුෂානා මෆුර් මියට මෙතෙක් ගුරු සහායක පත්වීමක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇයට ගුරු සහායක පත්වීම නොපමාව ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

197/'15

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේදී එහි සේවය කළ 3100ක් වූ සේවක සංඛ්‍යාවෙන් 1500ක පමණ පිරිසකට රැකියා අහිමි වූ බවත්;

(ii) යම් ආයතනයක් පරික් ආයතනය හරහා විකිණීමේදී සේවකයින්හට හිමිවිය යුතු 10% ප්‍රතිලාභයද ඔවුන්ට අහිමි වූ බවත්; සහ

(iii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් අනුව පසුගිය පාලන සමයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නැවත රජයට පවරා ගැනීමක් සිදු වුවද, සේවය අහිමි වූ සේවකයන් සැම දෙනාම නැවත සේවයේ පිහිටුවීමක් සිදු නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවත රැකියාව නොලැබීමෙන් අසාධාරණයට ලක්වූ සේවකයින්ට විසඳුමක් ලබාදීම සඳහා කටයුතු කරන්නේද; සහ

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

203/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභ්‍යාසලාභී උපාධිධාරීන්ට, සංවර්ධන සේවා ව්‍යවස්ථාවට අනුව ස්ථිර පත්වීම් ලබාදීම සඳහා අංක 12/0030/523001 හා 2013.01.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අනුමතිය ලැබී ඇති බවත්;

(ii) එසේ දකුණු පළාත් ස්ථිර රාජ්‍ය සේවය සඳහා බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ පත්වීම් දිනය ලෙස, වසරක පුහුණු කාලය අවසන් වූ දිනය හෝ එම දිනය රජයේ නිවාඩු දිනයක් වේ නම්, එයට පසුව යෙදෙන පළමු වැඩකරන දිනය සේ සලකන මෙන්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් තම 2014.11.18 දිනැති CS/DOS/21 අංක දරන ලිපිය මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත දන්වා ඇති බවත්; සහ

(iii) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/2/13/GRAD/1-V හා 2014.08.12 දිනැති තීරණය ප්‍රකාරව, G/SP/12/08 හා 2014.11.18 දිනැති ආණ්ඩුකාර තීරණය මගින්, මාතර දිස්ත්‍රික්කය සඳහා බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් 313 දෙනෙකු වසරක පුහුණු කාලයෙන් පසු ස්ථිර පත්වීම් සඳහා හිමිකම් ලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දකුණු පළාත් ස්ථිර රාජ්‍ය සේවයට අභ්‍යාසලාභී උපාධිධාරීන් අන්තර්ග්‍රහණය කර ඔවුන්ට හිමි හිඟ වැටුප් සහ සේවා කාලය ලබාදෙන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 දෙසැම්බර් මස 05 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

92/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා වෙන්වූ පාසල් වෙනම පවත්වාගෙනයාමේ ප්‍රතිපත්තිය එතුමා පිළිගන්නෙහිද?

(ආ) හමුදාවේ පරිත්‍යාගශීලී වූ, නිලධාරීන් හා යුධ භටයන් දෙපිරිසම වෙනුවෙන් විශේෂ වරප්‍රසාද ලබාදීම අවශ්‍ය වුවත්, ඔවුන්ගේ දරුවන්ට වෙනම පාසල් තිබීමෙන් සමාජයේ නව සමාජ ප්‍රභේදයක් මත පහසුකම් ඇති කරනු ලබන බවත් එතුමා තවදුරටත් පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල්වල සිටින නිලධාරීන්ගේ දරුවන් හා සාමාන්‍ය සෙබළුන්ගේ දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) මෙවැනි පාසල්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතට ගෙන අනෙකුත් දරුවන්ද ඇතුළත් කරගෙන පවත්වාගෙන යාමට අදහස් නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

162/'15

ගරු චන්දිම ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි කලාපවල පදිංචි කළ මුල් ගොවි පවුල් මේ වනවිට සිය තුන්වන පරම්පරාව දක්වා විහිදී ඇති බවත්;

(ii) ඔවුන් මේ වනවිට තම පියාට හෝ සහෝදරයින්ට අයත් අක්කර 2 1/2ක වගා භූමිය හවුලේ වගා කරමින් උපයාගන්නා සුළු ආදායමින් මහත් අසීරුවෙන් ජීවත්වන බවත්; සහ

(iii) මුල් පදිංචිකරුවන්ට පදිංචිය සඳහා ලබාදුන් අක්කර 1/2 ක භූමි ප්‍රමාණය තුළ මෙම පරම්පරා තුනම කුඩා නිවාස සාදාගෙන දැඩි අසීරුවෙන් ජීවත්වන බවත් එතුමා දන්නෙහිද;

(iv) නොඑසේ නම් ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම පවුල් සඳහා අලුතින් වගා භූමි හා පදිංචියට ඉඩම් ලබාදීමේ සැලසුමක් තිබේද; සහ

(ii) එසේ නම්, එම සැලසුම් ක්‍රියාත්මක වන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහවැලි ව්‍යාපාරය තුළ තිබෙන මෙතෙක් පරිහරණයට නොගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම රක්ෂිත කවරේද;

(iii) යම් විශේෂ අවසරයක් මත, එම රක්ෂිතවලින් බාහිර පාර්ශ්වයන්ට බලපත්‍ර මත හෝ බදු පදනම් මත ඉඩම් ලබා දී තිබේද; සහ

(iv) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 දෙසැම්බර් මස 07 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

39/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා (එම වර්ෂ දෙකද ඇතුලත්ව) වසර 5 තුළ මැද පෙරදිග රටවලදී ලිංගික අපයෝජනයන්ට ලක්වූ ශ්‍රී ලාංකික කාන්තාවන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාන්තාවන් සේවය කළ මැදපෙරදිග රටවල් කවරේද; සහ

(iii) උක්ත එක් එක් කාන්තාව වෙනුවෙන් එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ලිංගික අපයෝජනයන්ට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයාට එරෙහිව ගත් පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදෙස්ගත වන ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද; සහ

(iii) ශ්‍රී ලාංකික කාන්තාවන් ගෘහ සේවය සඳහා විදෙස්ගත වීම සීමා කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

132/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සමුපකාර සමිති ව්‍යාපාරය පිළිබඳව පත්කරන ලද කොමිෂන් සභාවේ වාර්තාව එවකට ජනපතිනිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියට භාර දී තිබුණේද;

(ii) එම වාර්තාව මේ වනතුරු එළිදක්වා නොමැති නම්, එයට හේතු කවරේද; සහ

(iii) එය මහජනයා අතට පත්කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු පරිභෝජනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) මෙම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන හා පිටරටින් ගෙන්වන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම අමුද්‍රව්‍ය මිනිස් සිරුරට අහිතකර ද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂා කරන ආයතනයක් රට තුළ තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද; සහ

(iv) එම ආයතනය මගින් පරීක්ෂා කිරීමේදී මිනිස් සිරුරට හානිකර අමුද්‍රව්‍ය භාවිතා කරමින් හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු නිෂ්පාදනය කළ ආයතන හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් නිෂ්පාදනය කිරීමේදී මිනිස් සිරුරට අහිතකර රසායන ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමට පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

181/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ හඳුනාගෙන ඇති එච්.අයි.වී. (HIV) ආසාදිතයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2015.10.30 දිනට හඳුනාගෙන ඇති මුළු HIV ආසාදිතයින් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට හඳුනාගෙන ඇති සමස්ත රෝගීන් සංඛ්‍යාව, වයස් කාණ්ඩ අනුව (අවුරුදු 10-15, 16-20, 21-30, 31-40 සහ 40ට වැඩි) වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ අතර සිටින පාසැල් සිසුන් සංඛ්‍යාව කොපමණද; සහ

(v) මෙම පිරිසට HIV ආසාදනය වී ඇති ආකාරය අදාළ සංඛ්‍යාව සමග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) රුධිර පාරවිලයනය හරහා ආසාදිත තත්ත්වයට පත්වූ රෝගීන් සඳහා රජය අනුගමනය කරනු ලබන නෛතික ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 08 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පැවති හම්බන්තොට තානායම පෞද්ගලික අංශයට පවරා ඇති බවත්;

(ii) එහි සේවය කළ සේවකයින් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇති බවත්; සහ

(iii) මෙම ක්‍රියාවලිය නාගරික සංවර්ධන අධිකාරියට මූල්‍යමය පාඩුවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ස්ථානයම නැවත නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

133/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ විශ්වවිද්‍යාල නොවන ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු, ගණකාධිකාරී හා වෙනත් වෘත්තීයවේදී පාඨමාලා සංඛ්‍යාව ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(ii) එම ආයතන එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාලවල ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iii) වර්ෂ 2012 සිට 2015 දක්වා එම ගාස්තුවල ඇතිවූ වෙනස්වීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

52/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ විශාඛා විද්‍යාලයේ උසස් පෙළ පන්ති සඳහා ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමේ දී සලකා බලන නිර්ණායක කවරේද;

(ii) 2015 වර්ෂයේ දී කොළඹ විශාඛා විද්‍යාලයේ උසස් පෙළ පන්ති සඳහා ඇතුළත් කර ගත් ශිෂ්‍යාවන්ට හැදෑරීමට ඇති විෂය ධාරාවන් කවරේද;

(iii) එම එක් එක් විෂය ධාරාවන් සඳහා නවක උසස් පෙළ ශිෂ්‍යාවන්ට ඇති පන්ති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පන්තියේ සිටින ශිෂ්‍යාවන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(v) 2015 වර්ෂයේ දී උසස් පෙළ හැදෑරීම සඳහා කොළඹ විශාඛා විද්‍යාලයට වෙනත් විද්‍යාලයන්ගෙන් ඇතුළත් වූ ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(v) හි සඳහන් එක් එක් ශිෂ්‍යාවගේ නම, දිස්ත්‍රික්කය, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන් පාසල හා උසස් පෙළ විභාගය සඳහා හදාරන විෂය ධාරාව වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(ii) විශාඛා විද්‍යාලයට ඇතුළත්වීම සඳහා එම එක් එක් ශිෂ්‍යාවට තිබූ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

182/’15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2012 එක්සත් ජාතීන්ගේ රෙගුලාසි අංක 1 හි 4(2) පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.03.21 දිනැති අංක 1854/41 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගැසට් නිවේදනයෙන් ත්‍රස්තවාදී කටයුතු හා බැඳුනු අපරාධවලට සම්බන්ධ බවට ප්‍රකාශයට පත්කරන ලද සංවිධාන සංඛ්‍යාව සහ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ සංවිධාන සහ පුද්ගලයින්ගේ සියලු තොරතුරු සහිත විස්තරයක් සභාගත කිරීමට කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එල්. ටී. ටී. ඊ. සංවිධානය විසින් 1976 වර්ෂයේ සිට සිදුකරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා පොලීසිය විසින් ඉහත ආ (i) හි සඳහන් සංවිධාන සහ පුද්ගලයින් පිළිබඳව විමර්ශන ආරම්භ කර තිබේද; සහ

(ii) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් 2001 සැප්තැම්බර් මස 28 වැනි දින සම්මත කරනු ලැබූ යෝජනා අංක 1373හි සඳහන් විධිවිධාන වලට අනුකූලව අදාළ සැකකරුවන් අප රටට ලබාදෙන ලෙස එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලින් ඉල්ලා සිටීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

50/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට තේ සමඟ පිටරට තේ මිශ්‍ර කර විදේශ වෙළඳ පොළට යවන බවත්;

(ii) තේ වල තිබිය යුතු ගුණාත්මකභාවය පහත වැටී ඇති බවත්;

(iii) විවිධ ද්‍රව්‍ය මිශ්‍ර කරන ලද තේ, වෙන්දේසියට ඉදිරිපත් කරන බවත්; සහ

(iv) එමගින් ලොව අංක එක දිනා සිටින Ceylon tea නාමයට කැළලක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දිනට මෙරට සිටින තේ අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද; සහ

(iii) ඔවුන් 2014 වසර තුළ අපනයනය කළ තේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පරීක්ෂා කරන ක්‍රමවේදය කවරේද;

(ii) තේ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය පිළිබඳව චෝදනා ලැබූ අපනයනකරුවෙකුට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) එවැන්නෙකුට ලබා දිය හැකි උපරිම දඬුවම කවරේද;

(iv) දඬුවම් ලැබූ නිෂ්පාදකයන් ඉහත (ආ) (ii) ලැයිස්තුවේ සිටීද;

(v) මේ සම්බන්ධයෙන් රටේ පවත්නා නීති ප්‍රතිපාදන ප්‍රමාණවත්වේද;

(vi) නොඑසේ නම්, එම නීති සංශෝධනයට පියවර ගන්නේද; සහ

(vii) එසේ නම්, එම සංශෝධන සිදු කරන්නේ කවර ආකාරයෙන්ද; කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

89/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ.පො.ස. (සා.පෙළ) සමත් තරුණ තරුණියන්, රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවලට බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ කුසලතාවයන් හා හැකියාවන් මත නොමිලේ ශිල්පීය හෝ වෘත්තීමය පුහුණුවක් ලබාදීම සඳහා දැනට ඇති පහසුකම් ප්‍රමාණවත්ද;

(ii) එසේ නොමැති නම්, පහසුකම් වැඩිකළ යුතු ප්‍රමාණය කවරේද; සහ

(iii) වෘත්තීය හා ශිල්පීය පුහුණුව සඳහා ඇති විෂය මාලාවන් අදට කොතරම් ගැලපේද; එසේ නොමැති නම්, ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පුහුණුලාභීන් කිසිදු දේශපාලන බලපෑමකින් තොරව, සුදුසුකම් හා හැකියාවන් මත පමණක් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තියක් හා සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) රජයේ ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමේදී, පිරවීමට නියමිත තනතුරු සංඛ්‍යාව එම දැන්වීම සමග පළ කිරීමෙන් තරුණ තරුණියන් අනවශ්‍ය අපේක්ෂා භංගත්වයකට පත්වීම වැළැක්විය හැකි බව පිළිගන්නේද; සහ

(iii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

56/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට රැගෙන එන එළවළු සඳහා ගොවියාට සාධාරණ මිලක් නොලැබෙන බවත්;

(ii) කප්පම්කරුවන් හා අතරමැදියන් විසින් ගොවියාට වංචා කරන බවත්; සහ

(iii) දේශපාලන රැකවරණ මත කප්පම්කරුවන් ක්‍රියාත්මක වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ආර්ථික මධ්‍යස්ථානයේ දී ගොවියාට සාධාරණ මිලක් ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වන කප්පම්කරුවන් මැඩලීමට රජය ක්‍රියාකර තිබේද; සහ

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ අරමුණු හා ඉලක්ක කවරේද; සහ

(ii) මේ වනවිට එම අරමුණු හා ඉලක්ක ජයගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත මධ්‍යස්ථානයේ ඇති කඩ කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ අයිතිකරුවන්ගේ නම් හා ලිපින කවරේද;

(iii) ඉහත අයිතිකරුවන්ගෙන් රජය අය කරනු ලබන බදු මුදල කොපමණද;

(iv) මෙම කඩ කාමර අතුරු බදු දී තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එය නීති විරෝධී බව පිළිගන්නේද; සහ

(vi) ගොවි සංවිධානවලට හා ගොවි සමුපකාර සමිතියට ලබාදුන් කඩ කාමර දෙකෙන් ඔවුන් ඉවත් කළේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

183/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පිහිටුවා ඒවා මසකට වරක් රැස්විය යුතු බවට චක්‍රලේඛයක් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් නිකුත්කර ඇති බවත්;

(ii) පසුගිය වසර 30කට අධික කාලය තුළදී එම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සාර්ථකව ක්‍රියාත්මක වූ බවත්; සහ

(iii) ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පවත්වා නොමැති නම්, අදාළ කොට්ඨාස තුළ දේශපාලන හා සංවර්ධන කටයුතු අඩාලවීමට එමගින් විශාල බලපෑමක් එල්ලවිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත චක්‍රලේඛයට අනුව 2015 වර්ෂය සඳහා පිහිටුවා ඇති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු කවරේද;

(ii) ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු 332 සඳහා පත්කොට ඇති සභාපතිවරුන්ගේ නම් කවරේද; සහ

(iii) 2015 වර්ෂය තුළ එම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති වාර ගණන සහ දින කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) 2015 වර්ෂය තුළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පිහිටුවා ඇති දිස්ත්‍රික්ක කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම දිස්ත්‍රික් කමිටුවල සභාපතිවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති වාර ගණන සහ දින වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 දෙසැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

57/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.05.30 දින වනවිට රාජ්‍ය ආයතනයන්ගෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයවිය යුතු මුදල කොපමණද;

(ii) එම මුදල් අයවිය යුතු රාජ්‍ය ආයතන හා අයවිය යුතු මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) එම මුදල් අය කර ගැනීම සඳහා සංස්ථාව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015.05.30 දින වනවිට සංස්ථාව විසින් ණය, පොළී හා වෙනත් ගෙවීම් ලෙස ගෙවිය යුතුව තිබූ මුදල කොපමණද;

(ii) එම මුදල ගෙවිය යුතු ආයතන හා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) එම මුදල් ගෙවීම සඳහා සංස්ථාවට තෙල් මිල ඉහළ දැමීමට සිදුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර 05 තුළ සංස්ථාව ලැබූ ශුද්ධ පාඩුව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සංස්ථාව පාඩු ලැබීමට බලපා ඇති හේතු සම්බන්ධව පරීක්ෂණයක් සිදු කර තිබේද; සහ

(iii) එසේ නම්, එම හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

188/'15

ගරු ඊ. සරවනපවන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 7කට වැඩි කාලයක් අඛණ්ඩව එකම පාසලක සේවය කළ විදුහල්පතිවරු බොහෝ දෙනෙක් වෙනත් පාසල්වලට මාරු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) යාපන අර්ධද්වීපයේ එකම පාසලක අවුරුදු 7කට වැඩි කලක් සේවය කළ සියලුම විදුහල්පතිවරුන්ට ස්ථාන මාරු ලබා දී තිබේද;

(ii) යාපන අර්ධද්වීපය තුළ ස්ථාන මාරු ලබා නොමැති විදුහල්පතිවරුන් සිටීද; සහ

(iii) එසේ නම්, ඔවුන්ට ස්ථාන මාරු නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

29/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සබරගමුව පළාතේ, ඉතා වැදගත් බෞද්ධ සිද්ධස්ථානයක් වන කුරගල ඓතිහාසික පුදබිම තුළ කැණීම් කටයුතු සිදු කිරීම නවතා තිබේද; සහ

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරගල පූජා භූමියට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණයෙහි සීමා නිර්ණය කර තිබේද;

(iii) කැණීම් මගින් ලබා ගත් පුරා වස්තු රැක ගැනීමට පියවර ගෙන තිබේද; සහ

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කුරගල පූජා භූමියේ බෞද්ධ අයිතිය තහවුරු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එහි කැණීම් අඛණ්ඩව කිරීමට අවශ්‍ය පියවර ගන්නේද; සහ

(iii) එසේ නම්, ඒ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

184/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අමානුෂික ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතියෙන් වැරදිකරුවන් වී සිරදඬුවම් විඳින එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද; සහ

(ii) එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිදුකරනු ලැබූ අමානුෂික අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන 2015.10.30 දින දක්වා බන්ධනාගාරගතව සිටින සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් සිරකරුවන්ගේ නම්, ඔවුන්ට එරෙහිව ඉදිරිපත් වූ චෝදනා සහ සිරදඬුවම් කාලය;

(ii) ඉහත (අ) (ii) හි සඳහන් එල්.ටී.ටී.ඊ. සැකකරුවන්ගේ නම් සහ අදාළ සැකකරුවන් බන්ධනාගාරගත කළ දිනය;

(iii) ඉහත (අ) (ii) හි සඳහන් එල්.ටී.ටී.ඊ. සැකකරුවන්ගෙන් මේ දක්වා චෝදනා ගොනුකොට නොමැති සැකකරුවන් සිටී නම්, ඔවුන්ගේ නම් සහ ඔවුන් අත්අඩංගුවට පත් වූ දිනය; සහ

(iv) ඉහත (ආ) (i) හා (ii) හි සඳහන් පිරිස අතර බන්ධනාගාරගතව සිටින කාලය තුළදී ත්‍රස්තවාදී හෝ වෙනත් අපරාධවලට සම්බන්ධ වූ බවට බුද්ධි තොරතුරු වාර්තා ලැබී ඇති සැකකරුවන් සිටී නම්, ඔවුන්ගේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

64/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ගොවිජන සේවා බලප්‍රදේශ මට්ටමින් කුඹුරු ඉඩම් ගොඩකිරීම සම්බන්ධයෙන් 2014 හා 2015 වර්ෂයන්හිදී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව ගොවිජන සේවා බලප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලිවල වගඋත්තරකරුවන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම් කවරේද; සහ

(iii) ඔවුනට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන තිබේ නම්, එම ක්‍රියාමාර්ග එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නීත්‍යානුකූලව අවසර ලබාගෙන කුඹුරු ඉඩම් ගොඩ කළ පුද්ගලයන් මාතර දිස්ත්‍රික්කය තුළ සිටින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

(iii) ඉඩම් ගොඩ කිරීමට ඔවුන්ට අවසර දුන් හේතු කවරේද;

(iv) එක් එක් පුද්ගලයාට අවසර ලබා දුන් නිලධාරීන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ගොඩකිරීම සම්බන්ධව නඩු පැවරූ (ආ) (iv) හි සඳහන් පුද්ගලයන්ට අධිකරණය මගින් ලබා දුන් තීන්දු එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත තීන්දුව අනුව කටයුතු කළ පුද්ගලයින්;

(iii) එම තීන්දුව අනුව මෙතෙක් කටයුතු නොකළ පුද්ගලයින්; සහ

(iv) තීන්දුවට අභියාචනා කළ පුද්ගලයින්;

කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

185/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.10.30 දින වනවිට බන්ධනාගාරගතව සිටින සිරකරුවන් සංඛ්‍යාව ඔවුන් රඳවා සිටින බන්ධනාගාරය අනුව;

(ii) මුළු සිරකරුවන් සංඛ්‍යාව සිර දඬුවම් විඳින වරදේ ස්වභාවය අනුව; සහ

(iii) පළමුවරට, දෙවැනිවරට, තෙවැනිවරට හෝ ඊට වැඩි වාර ගණනක් දඬුවම් ලබා සිරගතව සිටින සංඛ්‍යාව ඒ ඒ වාරගණන අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් සිරකරුවෙක් සඳහා මාසිකව රජය දරන මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම සිරකරුවන් අතර සිටින,

(i) ස්ත්‍රීන් හා පුරුෂයින් සංඛ්‍යාව;

(ii) වයස අවුරුදු 17 ට අඩු දරුවන් සහ දැරියන් සංඛ්‍යාව;

(iii) වයස අවුරුදු 17 සහ 29 අතර සිටින තරුණ තරුණියන් සංඛ්‍යාව; සහ

(iv) වයස අවුරුදු 75ට වැඩි පුද්ගලයින් සංඛ්‍යාව;

බන්ධනාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) (i) මවුවරු සිරගත වීම නිසාම බන්ධනාගාර තුළ ජීවත්වන දරුවන් සිටින්නේ නම්, එම සංඛ්‍යාව; සහ

(ii) ආගම් අනුව සිරගතව සිටින පූජකවරු සංඛ්‍යාව;

බන්ධනාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

68/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඔළුවිල් වරාය ඉදිකිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) එම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) එම මූලාශ්‍රයන්ගෙන් ලබා ගත් ණය හා ආධාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iv) උක්ත ණය හා ආධාර සඳහා වාරික හා පොළිය ලෙස වාර්ෂිකව ගෙවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔළුවිල් වරාය 2013.09.01 දින ජනතා අයිතියට පත් කළ පසු පළමු වසර තුළ වරායේ ආදායම කොපමණද;

(ii) එම ආදායම් ශීර්ෂ කවරේද; එම එක් එක් ශීර්ෂය අනුව, ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔළුවිල් වරාය ජනතා අයිතියට පත් කර පළමු වසර තුළ වරායේ කටයුතු සඳහා වැය කළ වියදම කොපමණද; සහ

(iv) එම වියදම් ශීර්ෂ කවරේද; එම එක් එක් ශීර්ෂයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත දත්තයන්ට අනුව 2013.09.01 දින සිට මේ දක්වා ඔළුවිල් වරාය ලබා ඇති ලාභය හෝ අලාභය කොපමණද; සහ

(ii) ලාභය හෝ අලාභය කළමනාකරණය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

189/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, කොම්පඤ්ඤ වීදියේ පිහිටි ආරක්ෂක සේවා පාසල වෙනුවෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විද්‍යාලයේ සිසුන්ගෙන් මුදල් එකතු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අවසර ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම අවසරය ලබාදුන් ලිපිය සභාගත කරන්නේද;

(iv) සිසුන්ගෙන් එකතු කළ මුදල් බැරකර ඇති බැංකු ගිණුම කවරේද; සහ

(v) එහි පාසල් සංවර්ධන සමිති ගිණුමක් පවත්වාගෙන යනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 දෙසැම්බර් මස 12 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

82/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව බොරතෙල් ආනයනය කරන රටවල් කවරේද; සහ

(ii) 2013 හා 2014 වර්ෂයන්හිදී ඉහත රටවල්වලින් ආනයනය කරන ලද තෙල් ප්‍රමාණය හා ඊට වැය කළ මුදල එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇමරිකාව ඉරානයට සම්බාධක පැනවීමට පෙර ආසන්න වර්ෂ දෙකකදී ශ්‍රී ලංකාව ඉරානයෙන් ලබා ගත් බොර තෙල් බැරල් ප්‍රමාණය කොපමණද;

(ii) එතෙක් ඉරානයෙන් ලබා ගත් තෙල් ප්‍රමාණය සම්බාධක පැනවීමෙන් පසු ලබා ගන්නා රට කවරේද; සහ

(iii) තුන්වන පාර්ශවයක් හරහා ඉරාන තෙල් මෙරටට ගෙන් වූ බවට ඇති චෝදනාව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුව සඳහා දිනකට අවශ්‍ය වන බොර තෙල් බැරල් ප්‍රමාණය කොපමණද; සහ

(ii) හිඟයකින් තොරව ශ්‍රී ලංකාවට අවශ්‍ය තෙල් ප්‍රමාණය ලබා දීමට සැපයුම්කාර රටවල් පසුගිය වසර දෙක තුළ සමත් වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

186/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.10.30 දින වනවිට බන්ධනාගාරගතව සිටින සැකකරුවන් සංඛ්‍යාව රඳවා සිටින බන්ධනාගාර අනුව; සහ

(ii) බන්ධනාගාරගතව සිටින මුළු සැකකරුවන් සංඛ්‍යාව චෝදනා ලබා සිටින වරදේ ස්වභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) මෙම සැකකරුවන් අතර සිටින;

(i) ස්ත්‍රීන් හා පුරුෂයින් සංඛ්‍යාව;

(ii) වයස අවුරුදු 17 ට අඩු දරුවන් සහ දැරියන් සංඛ්‍යාව; සහ

(iii) වයස අවුරුදු 17 සහ 29 අතර සිටින තරුණ තරුණියන් සංඛ්‍යාව;

බන්ධනාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත අ (i) හි සඳහන් සැකකරුවන් අතර සිටින;

(i) ආගම් අනුව පූජකයින් සංඛ්‍යාව; සහ

(ii) විදේශික සැකකරුවන් සංඛ්‍යාව අදාළ රට අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සැකකරුවන් අතරින් ත්‍රිවිධ හමුදාවන්ට අයත් සැකකරුවන් බන්ධනාගාරගත කළ දිනය, ඔවුන් අයත් වන හමුදාව සහ අත්අඩංගුවට ගැනීමේදී සේවය කළ දෙපාර්තමේන්තුව හෝ සේනාංකය වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(ii) ඔවුන් අතර සිටින රාජ්‍ය බුද්ධි සේවාවන්ට අයත් පිරිස කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

83/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන දෙමළ ජාතික බෞද්ධයන් පිළිබඳ සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම දෙමළ ජාතික බෞද්ධයන් සංඛ්‍යාව කොපමණද;

(iii) උතුරු පළාත තුළ ජීවත් වන දෙමළ ජාතික බෞද්ධයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් ආකාරයේ සංගණනයක් කර නොමැති නම්, එවැන්නක් සිදු කරන්නේද; සහ

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ දෙමළ ජාතික භික්ෂූන්වහන්සේලා වැඩ සිටින්නේද; සහ

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) යාපනයේ දෙමළ බෞද්ධ ජනතාවට තම ආගමික කටයුතු කරගෙන යෑමට හා දහම් අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කර තිබේද; සහ

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

190/’15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, කොම්පඤ්ඤ වීදියේ පිහිටි ආරක්ෂක සේවා පාසල, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පාලනය වන්නේද;

(ii) එම විද්‍යාලය පිහිටි භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා දී තිබේද;

(iv) එසේ නම්, පවරා දී ඇත්තේ කවුරුන් විසින්ද; පවරා දුන් දිනය කවරේද;

(v) එම විද්‍යාලයේ සිටින ගුරු මණ්ඩලය කොපමණද; සහ

(vi) විද්‍යාලයේ එක් එක් ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2008 වසරේ සිට මේ දක්වා එම විද්‍යාලය වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය වැය කළ මුදල, වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) එක් සිසුවකුගෙන් වසරකට අය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උක්ත පාසලේ, පාසල් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් හා ආරක්ෂක හමුදාවන්හි ඔවුන් දරන තනතුරු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 14 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

84/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.06.30 දින සිට 2015.06.30 දින දක්වා සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම රිය අනතුරු මගින් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණද;

(iii) එම මරණ සිදු වූ අනතුරට ආසන්නතම හේතුව එක් එක් අනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iv) මේ අනුව වැඩිම මරණ ප්‍රමාණයක් සිදු වූ හේතුව කවරේද; එහි අගය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ රිය අනතුරු අවම කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද; සහ

(iii) එම සැලසුම්වල ක්‍රියාත්මක කළ හා නොකළ සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

187/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මස 09 වැනිදා උදෑසන අරලියගහ මන්දිර පරිශ්‍රයේ දී රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සිදුවූවා යැයි වර්තමාන රජයේ වගකිව යුතු දේශපාලනඥයින් ප්‍රකාශ කළ බවත්;

(ii) එවැනි කුමන්ත්‍රණයක් සිදු වූ බවට විදේශ අමාත්‍යවරයා සහ රජයේ මාධ්‍ය ප්‍රකාශක අමාත්‍යවරයා විසින් කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාවේදී සහ පාර්ලිමේන්තු සභා ගර්භයේදී ප්‍රකාශ කළ බවත්;

(iii) එම කුමන්ත්‍රණය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් පරීක්ෂණයක් පැවැත්වූ බවත්; සහ

(iv) අදාළ පරීක්ෂණවලින් හෙළිවී ඇති කරුණුවලට අනුව හිටපු ජනාධිපතිවරයා හෝ හිටපු ආරක්ෂක ලේකම්වරයා ජනවාරි 09 වැනි දින කිසිදු රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සිදු කොට නොමැති බව තහවුරුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii) හි සඳහන් පොලිස් පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

(ii) එම පරීක්ෂණයට අනුව චූදිතයින්ට එරෙහිව නඩු පැවරීම සඳහා පොලීසිය කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද; සහ

(iv) එම පරීක්ෂණය අනුව, 2015 ජනවාරි 09 වැනි දින උදෑසන අරලියගහ මන්දිරයේදී කිසිදු රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සිදුවී නොමැති බවට ප්‍රකාශයක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

85/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, ලුම්බිණි විද්‍යාලයේ ලුම්බිණි රඟහල අබලන් වී ඇති බවත්;

(ii) එය අලුත්වැඩියා කිරීමට මෙතෙක් පියවර ගෙන නොමැති බවත්; සහ

(iii) එම රඟහල අබලන්ව පැවතීම එම පාසලට මෙන්ම කලා ක්ෂේත්‍රයටත් විශාල පාඩුවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලුම්බිණි රඟහල විවෘත කළ දිනය කවරේද;

(ii) එදින සිට මේ දක්වා එය ප්‍රතිසංස්කරණය කර තිබෙන වාර ගණන කොපමණද; සහ

(iii) අවසන් වරට එය ප්‍රතිසංස්කරණය කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලුම්බිණි රඟහල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට වැය කරන මුදල කොපමණද; සහ

(iii) එකී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

191/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 - 2014 දක්වා ශ්‍රී.ලං.ග.ම ය විසින් මිලදී ගනු ලැබූ නව බස්රථ සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) බස්රථ මිලදී ගැනීම සඳහා වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නව බස්රථ ලබාදුන් ඩිපෝ කවරේද; සහ

(iv) ලංකා අසෝක් ලේලන්ඩ් සමාගමෙන් WP NB - 6028, WP NC - 6049, WP NB - 6051, WP NB - 6057, WP NB - 6067, WP NB - 6671, WP NB - 7750, WP NB - 7751, WP NB - 7752, WP NB - 7967, WP NC - 0653, WP NC - 1307, WP NC - 1746 සහ WP NC - 2016 යන අංක දරන බස්රථ 14 මිලදී ගැනීම සඳහා කොපමණ මුදලක් වැයකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii) හි සඳහන් බස්රථ 14 දැනට ශ්‍රී. ලං. ග. ම. ය සතුව තිබේද; සහ

(ii) එසේ නම්, එම බස්රථ අයත් ඩිපෝ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 15 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

122/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.07.31 දින වනවිට බන්ධනාගාර නිලධාරීන්ගෙන් මිදී පලාගොස් ඇති සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා ඔවුන් රඳවා සිටි බන්ධනාගාර වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iii) එම සිරකරුවන්ට ලබා දී තිබූ දඬුවම් හා ඔවුන් කර තිබූ අපරාධ එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සිරකරුවන්ගෙන් මේ වනවිට අත්අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට නිදැල්ලේ සිටින සිරකරුවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කර තිබේද; සහ

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

192/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම, දියගම, මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයට අයත් භූමියේ විශාලත්වය කොපමණද;

(ii) එම භූමිය අයත්ව තිබූ රාජ්‍ය ආයතනය කවරේද;

(iii) එම භූමිය ක්‍රීඩා අමාත්‍යාංශයට හෝ වෙනත් රාජ්‍ය ආයතනයකට පවරාගෙන තිබේද;

(iv) එසේ නම්, එයට අදාළ ලියකියවිලි සභාගත කරන්නේද; සහ

(v) දැනට ක්‍රීඩාංගණයේ පරිපාලනය හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) රජය වැයකළ මුදල සහ පෞද්ගලික පරිත්‍යාග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ සඳහා මුදල් වෙන්කළ අමාත්‍යාංශ කවරේද;

(iv) ඉදිකිරීම් සඳහා මුදල් ලබා දුන් පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) ක්‍රීඩාංගණය, ක්‍රීඩා කටයුතු සඳහා ලබා දීම ඇරඹූ දින සිට මේ දක්වා අයකරගෙන ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(vi) එම මුදල් බැර කර ඇති ගිණුම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සම්බන්ධ "ක්‍රීඩා සංවර්ධන පදනමක්" තිබේද; සහ

(ii) එසේ නම්, ඒ සඳහා කැබිනට් අනුමතිය ලබාගෙන ඇත්තේ කවර අමාත්‍යවරයා විසින්ද; කවර දිනයකදීද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම් , ඒ මන්ද?

143/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ඉහළ යන බවත්; සහ

(ii) ඉදිරියේදී මෙම තත්ත්වය සමාජයට විශාල බලපෑමක් සිදු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 70ට වැඩි ජනගහනය කොපමණද;

(ii) එම ජනගහනය ගැහැණු හා පිරිමි ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) වැඩිහිටි ජනගහනය සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනගහනයෙන් විශ්‍රාම වැටුපක් හිමි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද; සහ

(ii) විශ්‍රාම වැටුපක් නොමැති පිරිසගේ සුභසාධනයට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) වැඩිවන වැඩිහිටි ජනගහනයෙහි ජීවන තත්ත්වය කළමනාකරණය කිරීමට සැලසුම් සකස් කර තිබේද; සහ

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

193/'15

ගරු ජයන්ත සමරවීර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන්වීමේ සිද්ධියට අදාළව, හමුදා බුද්ධි අංශයේ සේවයේ නියුතු හා විශ්‍රාමික නිලධාරීන් 11ක් අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කරමින් සිටින බවත්;

(ii) මීට අදාළව, හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගයක් මත, ගිරිතලේ හමුදා කඳවුරේ තිබූ රහසිගත ලේඛන, ඡායාරූප හා වාර්තා රහස් පොලීසිය විසින් පරීක්ෂා කිරීම සඳහා එම කඳවුරෙන් බැහැර කර ඇති බවත්;

(iii) මෙම ක්‍රියාමාර්ග නිසා බුද්ධි අංශය සතු, ජාතික ආරක්ෂාවට අතිශය වැදගත් තොරතුරු හෙළිදරව්වීමේ අනතුරක් තිබෙන බවත්;

(iv) මෙමගින් බුද්ධි අංශ නිලධාරීන් දුර්මුඛවීම හා අධෛර්යයට පත්වීමෙන් බුද්ධි ක්‍රියාවලි දුර්වලවීම මගින් ජාතික ආරක්ෂාවට නිෂේධනාත්මක බලපෑමක් සිදුවිය හැකි බවත්; සහ

(v) මෙම ක්‍රියාවලිය නිසා බුද්ධි අංශ නිලධාරීන්ගේ අනන්‍යතාවයන් හෙළිවීමෙන් 2002 මිලේනියම් සිටි සිද්ධියේදී මෙන් එම නිලධාරීන්ගේ ජීවිත දැඩි අවදානමකට ලක්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අ(i) හි සඳහන් බුද්ධි අංශ නිලධාරීන් දැනට රඳවා තිබෙන ස්ථානය කවරේද; ඔවුන් භාරව සිටින නිලධාරියා කවුරුන්ද; සහ

(ii) ඉහත ක්‍රියාවලිය නිසා බුද්ධි අංශ නිලධාරීන්ට එල්ල විය හැකි ජීවිත අවදානම් වළක්වා ඔවුන් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 16 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

144/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ වනජීවීන්ට සිදු කළ හානි සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ රජයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා සේවා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් සිදු කළ වැරදි එක් එක් නිලධාරියාට වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iv) එම නිලධාරීන්ට ලබා දුන් දඬුවම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය නිලධාරීන්ගෙන් වනජීවීන්ට සිදු වන හානි අවම කිරීමට පියවර ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

145/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රදේශයේ හුලංදාව වතුයාය ආශ්‍රිතව ජීවත් වන ජනතාවට අවම මූලික පහසුකම්වත් නොමැති බවත්; සහ

(ii) එම නිසා එම ජනතාව දැඩි අපහසුතාවන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හුලංදාව වතුයායේ ජල, මාර්ග, නිවාස හා සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;කවර දිනක සිටද; සහ

(iii) ඒ සඳහා වැය කිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

146/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක වීසා මත ශ්‍රී ලංකාවට පැමිණ නීති විරෝධී ලෙස මෙරට රැඳී සිටිමින් විවිධ ආගම් ප්‍රචාරය කිරීම, විවිධ රැකියා හා ව්‍යාපාර වල නිරත වීම සහ සමාජ විරෝධී කටයුතු වලට සම්බන්ධ වීම හේතුවෙන් 2015 වසර තුළදී අත්අඩංගුවට ගත් සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අයත් රටවල් කවරේද; සහ

(iii) ඔවුන් සිදු කරන ලද නීති විරෝධී කටයුතු හා ලබාදුන් දඬුවම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක වීසා මත පැමිණ නීති විරෝධීව මෙරට රැඳී සිටින විදේශිකයන් අත්අඩංගුවට ගැනීමට විශේෂ වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) මොවුන් සඳහා බලාත්මක නීති රෙගුලාසි තවදුරටත් දැඩි කිරීමට කටයුතු කරන්නේද; සහ

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

147/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෝගම්බර බන්ධනාගාරයෙන් රැඳවියන් ඉවත් කළ පසු එය පිරිසිදු කිරීම සඳහා වැය කළ මුදල කොපමණද; සහ

(ii) එම මුදල සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝගම්බර බන්ධනාගාරය වර්තමානයේ භාවිතා කරනු ලබන්නේ කුමන කටයුත්තක් සඳහාද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනකට හෝ පුද්ගලයෙකුට ලබා දී තිබේද; සහ

(iii) එසේ නම්, එම ආයතනයේ හෝ පුද්ගලයාගේ නම, ලිපිනය හා දුරකථන අංකය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

155/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හේන් වගාව, සතුන් දඩයම් කිරීම හා විවිධ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තරවලට හානි සිදු වන බවත්;

(ii) එම හානි වළක්වා ගැනීමට නොහැකි වී ඇත්තේ ඉහළ නිලධාරීන්ගේ හා දේශපාලනඥයන්ගේ මැදිහත් වීම නිසා බවත්; සහ

(iii) උක්ත වන හානිය සමස්ත ශ්‍රී ලංකාවේම දේශගුණික, ආර්ථික හා සමාජීය වශයෙන් බලපෑම් ඇති කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර දෙකක කාලය තුළ මෙම වනාන්තර තුළ දඩයම් කිරීම හා හේන් වගා කිරීම සම්බන්ධව නීතිය ඉදිරියේ වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත තුළ දඩයම් කිරීම හා හේන් වගාව නැවැත්වීමට පියවර ගෙන තිබේද; සහ

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රක්ෂිතයන්හි ආරක්ෂාව සඳහා දැනට තිබෙන මානව හා භෞතික සම්පත් සම්බන්ධව සෑහීමකට පත්වන්නේද; සහ

(ii) නොඑසේ නම්, රක්ෂිතයන්හි ආරක්ෂාව තර කිරීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 19 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

32/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ග්‍රාමීය මාර්ග රැසක් අබලන් තත්ත්වයේ පවතින බවත්; සහ

(ii) එහෙයින් එම ජනතාව දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂය තුළ මාතර දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම මුදල මගින් සංවර්ධනය කරන ලද මාර්ග කවරේද; සහ

(iii) එම එක් එක් මාර්ගයට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධනය නොකළ මාර්ග පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එසේ නම්, එම මාර්ග කවරේද;

(iii) එම මාර්ග අවසන් වරට ප්‍රතිසංස්කරණය කර ඇති දිනය වෙන් වෙන් වශයෙන් කවරේද?

(iv) එම මාර්ග සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කර තිබේද; සහ

(v) එසේ නම්, එම සැලසුම් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

40/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැතිනාගල, ඓතිහාසික වශයෙන් වැදගත් පූජාභූමියක් බවත්;

(ii) එම පූජා භූමියේ ගල් කැඩීමට මීට ඉහත අවස්ථාවක ඉඩදී ඇති බවත්; සහ

(iii) එහිදී ප්‍රදේශයේ ජනතාව ඊට එරෙහි වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඓතිහාසික ස්ථානයෙහි ගල් කැඩීම සඳහා නැවත අවසර ලබා දී තිබේද; සහ

(ii) එලෙස ගල් කැඩීම සඳහා අවසර ලබා දුන්නේ කවරෙකු සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කැතිනාගල පුරාවිද්‍යා භූමිය සංරක්ෂණය කිරීමට පියවර ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණින්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව අභාවයට ගිය බැවින්, මෑත යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුළු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිවාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල්

සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.136/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.137/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම,— රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'15

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි හමුදා කඳවුරු වෙනත් ස්ථානවල පිහිටුවීම,— ත්‍රිකුණාමල නාවුක කඳවුර, උතුරු සහ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය

සඳහා වූ ප්‍රධාන හමුදා කඳවුර වුවද, යුද්ධය අවසන් වූ පසු පුල්මුඩේ සිට ලංකා පටුන දක්වා කුඩා නාවුක හමුදා සහ යුද හමුදා කඳවුරු ගණනාවක් පිහිටුවා ඇති අතර මේවා ව්‍යවසායකත්වයට, ධීවරයින්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ක්‍රියාකාරකම් වලට බාධකයක් බවට පත්වී ඇති බැවින් හමුදා කඳවුරු සාමාන්‍ය ජන ජීවිතයට උපකාර කිරීම පිණිස වෙනත් ස්ථානවල පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'15

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ඔලුවිල්, පාලමුනේ වරාය ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම,— මීටර් 400 ක පමණ ප්‍රදේශයක් තුළ පිහිටි ජනතාව පදිංචි ඉඩම් සමුද්‍ර ඛාදනයට ලක්වී ඇති බැවින් සහ එම ප්‍රදේශයේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති ජලාපවහන පද්ධතිය අවහිර වීම හේතුවෙන් ප්‍රදේශ 10 කට අධික ගම්මානවල ඩෙංගු වැනි මාරාන්තික රෝග පැතිරෙමින් තිබෙන බැවින් සහ ප්‍රදීපාගාරය ද, වරාය සතු නිවාඩු නිකේතනය ද, සමුද්‍ර ඛාදනය නිසා අවදානම් සහගත තත්ත්වයකට පත් වී ඇති බැවින් ඔලුවිල්, පාලමුනේ වරාය ආශ්‍රිතව ඉදිකරනු ලබන දිය කඩනයේ වැඩ කටයුතු සම්පූර්ණ කළ යුතු බවටත්, එකී ධීවර වරාය එම ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනවත් විය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'15

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ගවයින් සඳහා සුදුසු තෘණ බිම් වෙන් කිරීම,— ආසන්න වශයෙන් ගවයින් 250,000කට පමණ තෘණ භූමි අවශ්‍යව සිටින බැවින් සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සපුරාගැනීම සඳහා වෙන් කරන ලද තෘණ භූමි දිස්ත්‍රික්කය තුළ පිහිටා නොමැතිකම නිසා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සුදුසු තෘණ භූමි ප්‍රකාශකර, වෙන්කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ආගමික පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්ධනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම සඳහා දීර්ඝ කාලීන පිළියමක් ලෙස පාසල් සිසුන් ඉරිදා උදෑසන දහම් පාසල්, අහදියා (ආගමික) පාසල් යෑම අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.145/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රජයේ ආයතනවලින් ජනතාවට සිදුවන අකටයුතුකම් පිළිබඳ සොයා බැලීමට ආයතනයක් පිහිටුවීම,— රජයේ ආයතන මගින් විවිධ සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවට සිදුවන අකටයුතුකම් සහ අසාධාරණකම් පිළිබඳ සොයා බැලීම සඳහාත්, එම අසාධාරණකම් විභාග කිරීම සඳහාත් නෛතික බලයක් සහිත ආයතනයක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— රට තුළ ඇති යුදමය නටබුන් ප්‍රතිසංස්කරණය කර ජනතා යහපත පිණිස යොදාගැනීම,— රටේ පැවති යුදමය වාතාවරණය හේතුවෙන් ද, යුදමය ක්‍රියාන්විතයන් හේතුවෙන් ද, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළු රටේ සියලුම ප්‍රදේශවල විනාශව තිබෙන්නා වූ ගොඩනැගිලි, ජල ටැංකි, දුම්රිය, බස්රථ හා ගුවන් යානා ආදිය ප්‍රදර්ශන ස්ථාන ලෙස ද, ආරක්ෂක ස්ථාන ලෙස ද, රජයේ වියදමින් නොකඩවා නඩත්තු කර පවත්වාගෙන යෑම ජාතීන් අතර සංහිඳියාව ගොඩනංවා ගැනීමට බාධාවක් වී ඇති බැවින්, රටේ වත්මන් තරුණ පරම්පරාව සහ අනාගත පරම්පරාව අතරින් රටේ සිදුවූ යුදමය විනාශයන් සම්බන්ධ මතකයන් තුරන් කිරීමේ අරමුණින් යුතුව මෙලෙස විනාශයට පත්වූ ස්ථාන හා අනෙකුත් දේපළ නැවත ප්‍රතිසංස්කරණය කර මහජන යහපත උදෙසා ඒවා භාවිතා කිරීමට රජය නිර්මාණාත්මක පියවරක් ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම,— දශක ගණනාවක සිට උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය තුරන් වී සාමකාමී ජීවන රටාවකට ජනතාව දැන් අවතීර්ණ වී සිටින අතර පසුගිය කාලයේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් නිසා ද, යුදමය වාතාවරණය හේතුවෙන් ද, ඝාතනයට ලක්වූ සියලු ජාති, ආගම් හා සමාජවලට අයත්, සියලුම භාෂාවන් කතාකරන ජනතාව, ශ්‍රී ලාංකිකයින් ලෙස සිහිපත් කරමින්, එම ජනතාව මව්බිම වෙනුවෙන් ද, ඔවුන් කළ පරිත්‍යාගයන්වලට ගෞරව කිරීම සඳහා ද, උතුරු පළාතේ ඕමන්තේ ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක "අනුස්මරණ ස්මාරකයක්" තැනීමට ද, එම යුදමය තත්ත්වය නිසා දිවි අහිමි වූ සියලුම ජාති, ආගම් හා භාෂාවන් කථා කරන ජනතාව සිහිගැන්වීම සඳහා සුදුසු දිනයක් නම් කොට සෑම වසරක් පාසාම එම දිනය සැමරීමට ද රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.148/'15

ගරු ප්‍රසන්න රණවීර මහතා,— රජයේ සේවකයින්ගේ මූලික වැටුපෙන් ගණනය කරන 40% අවකරණ සීමාව දීමනා සහිත දළ වැටුපට ගණනය කිරීම,— රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අනුව ණය ලබා ගැනීමේ දී 40% අවකරණ සීමාව ගණනය කරනුයේ මූලික වැටුප මත පදනම්ව වන බැවින්, රාජ්‍ය සේවකයින්ට හදිසි අවශ්‍යතාවකට හෝ නිවාස අලුත්වැඩියාවකට රාජ්‍ය බැංකුවකින් හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමට මෙම යල්පැන ගිය නීතිය බාධාවක් වන අතර, හත් වසරක දේපළ ණය ලබා ගැනීමේ දී, පස් වසරක ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් ද සලකා බලන හෙයින්, මෙම අවකරණ සීමාව අදාළ නොවුණ ද, රජයේ සේවයට අලුතින් බැඳෙන රාජ්‍ය සේවකයෙකුට ඉහත අවකරණ සීමාව හේතුවෙන් ණය මුදලක් ලබා ගැනීම දුෂ්කර වන බැවින් 40% අවකරණ සීමාව දීමනා සහිත දළ වැටුප මත ගණනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.149/'15

ගරු හේෂා විතානගේ මහතා,— මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ නිසි ප්‍රමිතියක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන බහුතරයක් සුදුසුකම් ලත් පාලිකාවන් නොමැතිවීම, නුසුදුසු ස්ථානයක පවත්වාගෙන යාම සහ දරුවන්ට නොගැලපෙන විෂය පථයක් ඉගැන්වීම සහ නිසි ප්‍රමිතියකින් තොරවීම මෙන්ම, මේවා වැඩිදියුණු කිරීම පිණිස පළාත් සභා මගින් සිදු කර ඇති මැදිහත් වීම ද සතුටුදායක තත්ත්වයක නොමැති බැවින් අනාගත දරු පරපුර වෙනුවෙන් මහඟු මෙහෙයක් කිරීම අරමුණු කොට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.150/'15

ගරු හේෂා විතානගේ මහතා,— උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙසත්, දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හැල්ලුවට පත් නොකිරීමට වගබලා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'15

ගරු හේෂා විතානගේ මහතා,— වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම,— වතු ආශ්‍රිත දමිළ ජනතාව ජීවත්වන පරිසරය තුළ විදුලිය, ජල පහසුකම් සහ යටිතල පහසුකම් අවම මට්ටමක පවතින අතර එම තත්ත්වය පාසල් දරුවන්ගේ අධ්‍යාපන

කටයුතුවලටත්, එම ජනතාවගේ පෞද්ගලික ජීවිතයටත් බාධා ඇතිකරන බැවින්, මෙම ලයින් නිවාස සංස්කෘතිය නිමා කර ඒ සඳහා නව විධිමත් තනි නිවාස ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය කඩිනම් වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— දේශපාලන හේතූන් මත දිවි නැගුම ප්‍රතිලාභ අහිමිකර ඇති අයට කඩිනමින් සහන සැලසීම,— දිවයින පුරා ක්‍රියාත්මක දිවි නැගුම වැඩසටහන යටතේ දිවි නැගුම දීමනා ලැබිය යුතු විශාල දිළිඳු පිරිසකට දේශපාලන හේතූන් මත එම දීමනාවන් ලබා ගැනීමේ අවස්ථාවන් මග හැරී ඇති බැවින්, කිසිදු භේදයකින් තොරව එම දීමනාවන් ලැබිය යුතු සියලුම දිළිඳු අයට කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මහල් නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හා නිවාස හිඟයට පිළියමක් වශයෙන් මහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි ආයතනවලට අයත් වගා නොකළ ඉඩම් තෝරාගෙන මහල් නිවාස ක්‍රමයක් ඇතිකොට නිවාස නොමැති මහනුවර දිස්ත්‍රික් මධ්‍යම පාන්තික ජනතාවට කඩිනමින් නිවාස ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— වසර 12 ක ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි ත්‍රිවිධ හමුදා සෙබළුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම,— ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සේවයේ වසර 22 ක් සම්පූර්ණ වූ පසු විශ්‍රාම යෑමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින්, උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී වසර 12 ක් අඛණ්ඩව සේවය කොට එම සේවාවෙන් ඉවත් වී සිටිනා අයවලුන් දැනට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බැවින් එම ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සේවය කළ අයට අර්ධ විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකසා එම අයට සහනයක් සැලසීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.156/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පවත්නා මාර්ග තදබදය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ දෙවැනි අගනගරය වන මහනුවර නගරය දේශීය හා විදේශිකයන්ගේ සංචාරක මධ්‍යස්ථානයක් වන හෙයින් ද, මහනුවර නගරයට එදිනෙදා විශාල පිරිසක් පැමිණෙන අතර එම ජනතාව මහනුවර නගරයේ හා අවට මාර්ගවල ඇති අධික රථ වාහන තදබදය නිසා මහත් අසීරුතාවයකට පත්වන බැවින් ද, මහනුවර නගරයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.157/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රිය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'15

ගරු ජේ. සී. අලවතුවල මහතා,— සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අධ්‍යාපන ක්ෂේත්‍රයේ පත්වීම් ලබා දීම,— සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟාවලිය/ යෞවන සමාජ ක්‍රීඩා උළෙල/ ජාතික මහා ක්‍රීඩා උළෙල ආදී තරඟ වලින් සමස්ත ලංකා මට්ටමින් පළමුවැනි, දෙවැනි හා තෙවැනි ස්ථාන හිමි කරගත් ක්‍රීඩකයින් සහ සමූහ තරඟවලදී ශූරතාව හා අනු ශූරතාව දිනූ කණ්ඩායමේ ක්‍රීඩකයින්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරුන් ලෙසත් ක්‍රීඩා නිලධාරීන් ලෙසත් පුහුණුවක් ලබාදී තනතුරු ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු, ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන පිරවීම සහ තරඟ විභාගයෙන් නිදහස් කර III ශ්‍රේණියට පත්කිරීම,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම සම්බන්ධව නිසි විශ්ලේෂණයක් කර මෙම තනතුරුවලට අදාළ රාජකාරිවල නිරත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ඔවුන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාතේ පළාත් සභාව යටතේ ඇති පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන් විදුහල්පති තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කිරීම,— උතුරු පළාත් සභාව යටතේ ඇති පාසල්වල දීර්ඝ කාලයක් සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් වැඩබලන විදුහල්පතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.